

සමාජ සංවර්ධනය පිළිබඳ

# බෞද්ධ ආකල්පය

අතිපූජ්‍ය
නත්තරන්පොත චන්දිම තෙර
බ්‍රිස්බේන්

බුදුසමය භාරතයේ පහළ වන විට සමකාලීන භාරතීය සමාජ ක්ෂේත්‍රයේ හි ආගම් විසින් ඇති කොට තිබූ සමාජ තත්ත්වය එතරම් සතුටුදායක විනැ යි කීම අපහසුය. බ්‍රාහ්මණ ආගම නිර්මාණ වාදයේ පිහිට ලබමින් කරන ලද්දේ සමාජය වර්ණ හා ආශ්‍රම ධර්මවලින් - මිනිසා මිනිසා ගෙන් බෙදා වෙන් කිරීමයි. සමාජය භේද භින්න කිරීමයි. මේ නිසා සාමාන්‍ය දිවි පැවැත්වීමේ දී ඉතාමත් තදින් වර්ණ භේදය සමාජය තුළ බලපවත්වන ලදි. බ්‍රාහ්මණ ආගම විසින් ඉන්දීය සමාජය තුළ ඇති කරන ලද මේ ප්‍රශ්නය සමාජයේ සෑහෙන විපරියාසයන් කීපයකට මූලික විනැයි කිව යුතුය.

බුදු දහම පහළ වනවිට මේ තත්ත්වය බෙහෙවින් උග්‍රව පැවති අතර එම ප්‍රශ්නය විසඳීමට සමකාලීන ආගමික නායකයන් ඉදිරිපත් වූ බවක් නොපෙනේ. පුද්ගලයාගේ විමුක්තිය පිළිබඳ ප්‍රශ්නය මිස වෙනත් දෙයක් කථා කිරීමට අවශ්‍යතාවයක් සමකාලීන ආගමික ව්‍යාපාරවලට නොවීය. කරුනු මෙසේ හෙයින් මිනිසාගේ ලෝකොත්තර විමුක්තිය මෙන්ම ඉතාමත් පැහැදිලිවම ඔහුගේ සාමාජික ගැටළු විසඳාලීම අවශ්‍යයෙන්ම කළ යුතුය යන අදහස බුදුදහම පිළිගත් බව පෙනෙයි. මේ නිසා බෞද්ධ හේතුඵල දර්ශනය පදනම් කරගත් කර්මවාදය තුළින් මිනිසාගේ ස්වාමීත්වය මිනිසා වෙතම පවරා දෙන ලදි. පුද්ගල ජීවිතයේ දියුණුවට හෝ පරිහානියට උසස් බවට හෝ පහත් බවට වගකිව යුත්තේ මැවුම්කාර දෙවියෙකු නොව, එම පුද්ගලයාමය. මේ ආකාරයට මිනිසා පිළිබඳව බෞද්ධ දර්ශනය පුද්ගල ස්වාමීත්වය පුද්ගලයාට ම පවරා දුන් අතර සමානාත්මකතාවය බෞද්ධ සමාජ දර්ශනයේ මූලික පදනම කර ගත්තේය. ජීව විද්‍යාත්මක, ආචාර විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා ඓතිහාසික යන සතර ආකාර තර්ක ක්‍රමයක් මගින්. මිනිසා තවත් මිනිසෙකු ගෙන් වෙන් කොට හඳුනා ගත හැකි කිසිඳු සාදකයක් නොමැති බව වාසෙ-වධි හා අතියලායන ආදී සූත්‍රවලදී කරුණු සහිතව පෙන්වා දුන්හ. මේ නිසා සමාජයේ සියලු මිනිසුන් සමාජ ජීවිතය තුළ කවර හෝ උස් පහත් භේදයකින් තොරව සමාන අයිතිවාසිකම්, ලැබිය යුතු බව බුදුදහම අවධාරණය කළ බව පෙනෙයි.

සමානාත්මකතාවය පදනම් කරගත් සමා-ජයක් හැඩ ගැස්වීමේදී ක්‍රියා කළ යුතු ආකා-ාරය, ධාර්මික සැකැස්ම සිගාලෝවාද සූත්‍රයෙන් පෙන්වා දුන් සේක. මේ කරුණු සියල්ල කැටිකොට පරීක්ෂා කර බලන විට පූර්ණ තෘප්තිමත් සමාජයක් බිහි කිරීමේදී එම සමාජය අංග දෙකකින් සංවර්ධනය විය යුතුය යන්න පැහැදිලි බෞද්ධ මතය වූ බව පෙනේ.

පළමු වැන්න ආර්ථික සංවර්ධනයයි.
දෙවැන්න ධාර්මික සංවර්ධනයයි.

දිළිඳු බවෙන් පිරි මිනිසුන් ඇති සමා-ජයක ගුණදහම් දියුණුවක් කිසිසේත් ඇති කළ නොහැකිය, යන්න බුදුරජුන් බැස සිටි නිගමනයයි. මේ නිසා ලෞකික සමාජ රටාව තුළ ආර්ථික දියුණුව බෙහෙවින් අවශ්‍ය බව පිළිගන්නා ලදි. ධනය පිළිබඳ ඉතාමත් පැහැදිලි ප්‍රකාශය ප්‍රකට වන සූත්‍රයක් ලෙස චකකවතතිසීහනාද සූත්‍රය සැලකිය හැකිය. රටේ පොදු ආර්ථිකය නගා සිටුවීමේදී රට වැසියාගේ පොදු සහාය එයට ලබාගත යුතුය. එහි අනෙක් අදහස විනේ ඉතාමත් පැහැදිලිවම සමාජයේ වෙසෙන සෑම පුද්ගලයෙකුම ජාතික ධන නිෂ්පාදනයේ හවුල්කරුවෙකු වීමයි. වැඩිදුරටත් එයින් අනාවරණය වන්නේ ශ්‍රමය අනිවාර්‍ය වීමයි. මෙසේ නිෂ්පාදනය පොදු ජනතාවගේ සහභාගීත්වය ලද ආර්ථිකයක් බවට පත් නොවූ කල්හී, එනම් රටක ධන නිෂ්පාදන අංශ සුළු පිරිසකට අයත් වී වැඩි පිරිස විරක්ෂ ස්වරූපයට පත්වීම රටේ දිළිඳු බව වැඩිවීමට හේතුවන බවක් ඒ දිළිඳු බව තුළින් රටේ සදාචාර සංවර්ධනය බිඳ වැටෙන බවත්, මිනිසාගේ ආයු කාලය පවා සදාචාර පරිහානියෙන් පසු පහළ වැටෙන බවත්, හේතුඵල න්‍යායට අනුව බෞද්ධ දර්ශනය පැහැදිලි කරයි.

''අධනානං ධනෙ අනනුප්පදීය මා නෙ දාලිද්දියං වෙපුලල මගමාසී, දුළිද්දියෙ වේපුලලං ගතෙ අදිනනා දානං
වෙපුලල මනමාසී, අදිනනාදානෙ වෙපුලලං ගතෙ සත්ථං වෙපුලල මගමාසි, සතෙත වෙපුලලං ගතෙ පාණාතිපාතො වෙපුලල මගමාසි
පානාතිපාතෙ වෙපුලලං ගතෙ තෙසං සතතානං ආයුෂි - පරිහායි....

රටේ දිළිඳුකම වැඩි වනවිට හොරකම වැඩි වන බවත්, ඒ නිසාම ආයුධ පරිහරණය වැඩි වන බවත්, එයින්ම ජීවිත විනාශ කිරීම සිදුවන බවත්, බුදුසමය පිළිගෙන ඇත. මේ නිසා රටක වෙසෙන සියලුම ජන කොටස් ඇති - නැති භේදයකින් තොරව, සුඛිත මුදිතව විසීම සමාජ සංවර්ධනයට ඉතාමත් අවශ්‍ය මූලධර්මයක් ලෙස බුදුසමය සලකා ඇති බව මෙයින් හෙලිවේ. මේ ආකා රයෙන් සමාජයේ මනා පැවැත්මට මෙන්ම තෘෂ්ටි දායක ක්‍රියාකාරීත්වයට ධනය අවශ්‍ය යැයි පිළිගත් බුදුසමය එය උපයන ආකා-ාරය වැඩි දියුණු කරන ආකාරය, හා ආරක්ෂා කර ගන්නා ආකාරය පිළිබඳව සිගාලෝවාද, ව්‍යගගපජ්ජ වැනි සූත්‍රවලදී උපදෙස් රැසක් දී ඇත.

ධනය උපැයීමේදී, මත්පැනට ගිජුවීම, අවේලාවන් හී දී නුසුදුසු තැන්වල ඇවිදීම, දුකෙළිය - පාපමිත්‍ර සේවනය, අලසකම යන කරුණු නිසා තමා උපයන ධනය විනාශ වන බව දක්වා ඇත. මේ නිසා දැඩි උත්සාහයකින් ධනය රැස්කළ යුතු අතර එම ධනය තම යහපත හා සමාජයේ යහපත සඳහා යෙදවිය යුතු බව දක්වා ඇති අතර, මිනිසා ධනයේ වහලෙකු නොකර තමාට අයත් ධනය සිව් කොටසකට බෙදා එක් කොටසක්, පරිභෝගයටත්, කොටස් දෙකක් කර්මාන්තයන් හී යෙදවීමටත්, සිව්වෙනි කොටස තැන්පත් කිරීමටත් බුදු සමයෙන් උපදෙස් ලැබේ. එසේම ස්වාමි - සේවක දෙපක්ෂය අතර හොඳ හිත මනාව පැවතිය යුතු බව සඳහන් කරයි. සේවකයා ස්වාමියාට හිමි කර්මාන්තයේ දියුණුවට කටයුතු කළ යුතු අතර, සේවකයා ස්වාමියාගේ වහලෙකු නොවිය යුතුය. සේවකයාට ස්වාමියා විසින් සේවයට සරිලන වැටුපක් දීමෙන්, සේවකයාගේ තත්ත්වයට ගැලපෙන වැඩ පැවරී-මෙන්, තමන්ට ලැබෙන මිහිරි ආහාර සේවක-යාටත් ලබාදීමෙන්, ඔහුට අනුකම්පාව දැක්වීමෙන් සම්පූර්ණ සැලකිලි කළයුතු බව දක්වා ඇත.

මේ අයුරින් ආර්ථික අංශය සමාජයක දියුණු විය යුතු අතර, පූර්ණ සුචරිතවත් සමාජයක් බිහි වීමට එය පමණක් ප්‍රමාණවත් නොවේ.

*රටේ දිළිඳුකම වැඩි වනවිට හොර-කම වැඩි වන බවත්, ඒ නිසාම ආයුධ පරිහරණය වැඩි වන බවත්, එයින්ම ජීවිත විනාශ කිරීම සිදුවන බවත්, බුදුසමය පිළිගෙන ඇත.*

ආර්ථික දුෂ්කරතා මඟහැරී රට සුභික්ෂ වනවිට සමාජයේ වැරදි ආකල්පයන් සමාන ලෙස බෙදී යාමට සැලසීමත් යැයි කියන න්‍යාය ධර්මය බුදු සමය ඒ අයුරින්ම නොපිළි ගනී. ලෝකය අතෘප්තිකාමය, ඊර්ෂියාව, ක්‍රෝධය, වෛරය යනා දී විවිධ මානසික දුබලතා ආර්ථික සමානතාවය තුළින් පමණක් මිනිසා ගෙන් ඉවත් කිරීම කල හැකි නොවේ. මේ නිසා අංග සම්පූර්ණ සමාජයක් බිහිකරලීමට ඉතාමත් හොඳින් පුද්ගල මනස තුළ සංවර්ධනයක් ඇති කළ යුතු බව යන්න බෞද්ධ මතයයි.
ආධ්‍යාත්මික ගුණ ඉබේ ඇති වන්නක් නොවේ. මනුශ්‍යත්වය උත්තරීතරභාවයට පත් කරලීම සඳහා එම ගුණ දහම් මනස තුළ සංවර්ධනය කළ යුතුය. උත්තරීතරභාවය යනු මානසික සංවර්ධනයයි. ආර්ථික, සුභික්ෂ භාවයකින් යුතු සමාජයක් තුළින් පමණක් එම ගුණධර්ම වගාවට ලැබෙන්නේ ඉතා සුළු රුකුලක් පමණි. මේ නිසා ආර්ථික දියුණුවත් සමඟම කාර්මික අංශයේද එක හා සමානව සංවර්ධනය විය යුතු යන්න පිළිගත් මතයයි. සතිපට්ඨාන සූත්‍රයේ - කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන සතර ආකාර වූ අනුපස්සනාවන් ගෙන් බෞද්ධ මානසික සංවර්ධනය පැහැදිලිව දක්වා ඇත. එසේම සාමාන්‍ය මට්ටමෙන් ගත් කළ සමාජ යුතුකම වශයෙන් සැලකිය හැකි යුතුකම් රැසක් පුද්ගල ජීවිතය තුළ පුරුදු පුහුණු කළ යුතු යැයි සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇත. පුද්ගලයාගේ මානසික පවිත්‍රතාවය ඇති කිරීමට උපකාරී වන දාන, සීල, භාවනා නැමැති ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා සම්පූර්ණ කිරීම නිසා ලෝභ, දෝස, මෝහ නැමැති පහත් මානසික ආවේගයන් දුරු වී අලෝභ, අදෝස, අමෝහ නැමැති උසස් මානසික ආවේග මනස තුළ දියුණු වන බව දක්වා ඇත. අනුපුබ්බ සික්ඛා අනුපුබ්බ කිරියා, අනුපුබ්බ-පටිපදා වශයෙන් දක්වා ඇත්තේ, පුද්ගල ජීවිතයේ අධ්‍යාත්මික සංවර්ධනය ඇති කරන බෞද්ධ ශික්ෂණ ක්‍රමයයි.

මේ නිසා ආර්ථික සංවර්ධනය හා ධාර්මික සංවර්ධනය සමාජ ජීවිතය නැමැති ගොඩනැගිල්ල තැනීමට මුල් අඩිතාලම විය යුතුය. එසේ නොකර සමාජයට ආර්ථික අතින් පමණක් සංවර්ධනයක් කිරීම බලාපොරොත්තු විය නොහැකිය.







